විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව

ஓய்வூதியத் திணைக்களம்
DEPARTMENT OF PENSIONS

ශ්‍රී ලංකා විශ්‍රාම
இலங்கை ஓய்வு
Sri Lanka Pensions

පරපුරක අභිමානය    தலைமுறையொன்றின் பெருமிதம்    Pride of a Generation


මගේ අංකය / எனது இல. / My No. } විශ්‍රාම වැටුප් උපදෙස් ලිපි අංක : 06/2023

ඔබේ අංකය / உமது இல. / Your No. } ..........................

දිනය / திகதி / Date } 2023.05.17

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්,

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,

දෙපාර්තමේන්තු ප්‍රධානීන් / ත්‍රිවිධ හමුදාපතිවරුන් / දිස්ත්‍රික් ලේකම්වරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,


පළාත් පාලන ආයතන ප්‍රධානීන්,

**<u>නව විශ්‍රාමික හැඳුනුම්පත නිකුත් කිරීම</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් වන 2015.12.29 දිනැති විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ලිපි 8/2015 මෙයින් අවලංගු කරමි.

02. විශ්‍රාමිකයන් සඳහා විශ්‍රාමික හැඳුනුම්පත් ලබාදීමේ ක්‍රියාවලිය 2022 ජුනි මස සිට තාවකාලිකව අත්හිටුවන ලද අතර, එය 2023.04.10 දින සිට නැවත ආරම්භ කර ඇත.

03. PD 03 අයදුම්පත්‍රය සමඟ ඉදිරිපත් කරන විශ්‍රාමිකයාගේ ඡායාරූපය විශ්‍රාමික හැඳුනුම්පත් නිකුත් කිරීම සඳහා ද, භාවිතා කරන හෙයින් ඡායාරූපයෙහි සම්මත තත්ත්වයක් හා ගුණාත්මකභාවයක් පවත්වාගෙන යාම සඳහා 2023.06.01 දින සිට පළමුවරට PD 03 අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී පහත උපදෙස් අනුගමනය කළ යුතුය.




File name: NIC No.jpg
Eg: 123456789V.jpg


මාළිගාවත්ත, කොළඹ 10. மாளிகாவத்தை கொழும்பு 10. Maligawatta, Colombo 10.
Hot line: 1970, Direct line: 2209800, Fax: 2342078, Email: info@pensions.gov.lk, Web: www.pensions.gov.lk

- **ඡායාරූපයේ ප්‍රමාණය** - පාස්පෝට් ප්‍රමාණයේ වර්ණ ඡායාරූපයක් නිල් පසුබිම සහිතව ඉදිරිපස පෙනුම දැක්වෙන පරිදි වීම.
- ධාරිතාව - මෙගා බයිට් 01ක ධාරිතාවක් සහිතව “jpg” ආකාරයෙන් පද්ධතියට ඇතුළත් කිරීම.
- ඇඳුම - කාන්තා නිලධාරීන් සාරියකින් සැරසීම හා පිරිමි නිලධාරීන් කමිසයක් සහ ටයි පටියකින් සැරසීම.

04. ඒ අනුව පොලිස් නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන් ඇතුළු සියලුම රජයේ නිලධාරීන්ට අදාළව PD 03 අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමේ දී ඉහත උපදෙස් අනුව කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

**ඒ. ජගත් ඩී. ඩයස්**

විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත :**

01. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය } කරු.දැ.ගැ.ස.